00258

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 2021/2022**
**4 වන මට්ටම**
**අවසන් පරීක්ෂණය**
**LLU4707 – පවුල් නීතිය**

දිනය : 21.01.2023 කාලය : පෙ.ව.9.30 - ප.ව.12.30

අපේක්ෂකයන්ගේ අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

මුළු ප්‍රශ්න ගණන 08 යි.

ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සපයන්න.

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය**

**1.** පහත සඳහන් අවස්ථාවන්හි නෛතික තත්වය සාකච්ඡා කරන්න.

i. සියදෝරිස්, නිමල් හා කමල් නම් දරුවන් දෙදෙනෙකුගේ පියෙකි. සිය දේපළ අන්තිම කැමති පත්‍රයක් මගින් ඔහුව අවසන් කාලයේ රැක බලාගත් ඥාති දියණියක වන සුපිපිට උරුම කර ඔහු 2022 මිය ගියේය. මේ පිළිබඳ උරණ වූ නිමල් හා කමල් සියදෝරිස්ගේ නීත්‍යානුකූල දරුවන් වශයෙන් ඔවුන්ට සිය පියාගේ දේපළ උරුම විය යුතු බව පවසයි.


ii. රාසපුත්‍ර සහ සරස්වතී අඹු සැමියන් වේ. මීනා ඔවුන්ගේ එකම දියණිය වේ. විවාහයෙන් පසු ඔවුන් දෙදෙනා නුවරඑළියේ අක්කර 30 ක තේ ඉඩමක් මිළ දී ගත්හ. සාර්ථක තේ වගාවක් පවත්වාගෙන යාම නිසා ඉන් ලැබූ ලාභයෙන් ඔවුන් දෙදෙනාට එම ඉඩමට ආසන්නයෙන් තවත් අක්කර 10 ක තේ ඉඩමක් මිළට ගැනීමට හැකි විය. හදිසියේ ඇති වූ හෘදයාබාධයකින් රාසපුත්‍ර මිය ගියේය. හදිසි මුදල් අවශ්‍යතාවයක් නිසා සරස්වතී එම තේ ඉඩමෙන් කොටසක් විකිණීමට අදහස් කරයි. එම තේ ඉඩම සඳහා සරස්වතී සතු අයිතිය.

iii. උඩරට කාන්තාවක වූ බිසෝ මැණිකා 2008 දී උඩරටියෙකු වූ බණ්ඩාර සමග විවාහ විය. ඔවුනගේ විවාහය උඩරට නීතිය යටතේ දීග විවාහයක් ලෙස ලියාපදිංචි කළහ. විවාහයෙන් පසු බිසෝ මැණිකා බණ්ඩාරගේ නිවසේ පදිංචියට ගොස් වෛවාහක ජීවිතය ආරම්භ කළහ. මෑතක සිට බණ්ඩාර සිය බිරිඳ බිසෝ මැණිකාට ඇයගේ මහ ගෙදර පදිංචියට යන ලෙස පවසයි එසේ කිරීමෙන් ඇගේ පියාගේ දේපළ සඳහා අයිතිවාසිකම් කිවහැකි බව පවසයි.

iv. මජීඩ් සහ සුෆීෆා විවාහක මුස්ලිම් යුවලකි. ඔවුන්ට දරුවන් නොමැති හෙයින් ගවුඩීන් නම් පිරිමි දරුවකු දරුකමට හදා ගන්නා ලදී. මජීඩ් සහ සුෆීෆා දුම්රිය අනතුරකින් 2016 දී මිය ගියහ. හදා ගත් දෙමාපියන්ගේ දේපළ සඳහා ගවුඩීන් සතු අයිතිය.

**(5 x 4 = ලකුණු 20)**

**2.** පහත රූප සටහන ඇසුරෙන් වෛවාහක සහන සම්බන්ධ ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ නෛතික තත්වයන් සාකච්ඡා කරන්න




**(ලකුණු 20)**

**3. i.** දරුවකුගේ සුජාතභාවය සම්බන්ධ ගැටළු සඳහා සාක්ෂි ආඥා පනතේ 112 වගන්තිය නෛතික මගපෙන්වීමක් සිදුකරයි.

**ii.** පීතෘත්වය ඔප්පු කිරීමේ සැකසංකා නැති කොට දරුවකුගේ සැබෑ පියා කවුරුන්දැයි තීරණය කිරීමට DNA සාක්ෂි වෛද්‍ය විද්‍යාත්මක මගපෙන්වීමක් සිදු කරයි.

දරුවකුගේ සුජාතභාවය සම්බන්ධයෙන් ඉහත ක්‍රමවේද දෙකෙහි භාවිත කිරීම පිළිබඳ ශ්‍රී ලංකාවේ නෛතික තත්වය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. **(ලකුණු 20)**

4. යාපන වාසිකයෙක් වන ප්‍රකාශ් 2010 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨයට ඇතුළත් විය. ඔහු එම විශ්වවිද්‍යාලයේම වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලබන පරමේශ්වරී සමග පෙමින් බැඳුණි. ප්‍රකාශ් සහ පරමේශ්වරී එකම කුලයට අයත් නොවන බැවින් පරමේශ්වරීගේ දෙමාපියන් ඔවුන්ගේ සම්බන්ධතාවයට විරුද්ධ විය. ප්‍රකාශ්ට ගණකාධිකාරවරයෙකු වශයෙන් මඩකළපුවට පත් වීමක් ලැබුණ අතර පරමේශ්වරීටද මඩකළපුවේ රෝහලකට පත් වීමක් ලැබුණි. ඔවුන් විවාහ වීමට තීරණය කළ අතර 2017 දී යාපනයේ ප්‍රකාශ්ගේ නිවසේදී තාලි උත්සවය පැවැත්විණි. විවාහයෙන් පසු ස්වාමිපුරුෂයා සහ භාර්යාව වශයෙන් ඔවුන් මඩකළපුවේ ජීවත් වූහ. 2019 වර්ෂයේදී ඔවුන්ට පිරිමි දරුවකු ලැබුණි. මෑතකදී ප්‍රකාශ්ගේ මිතුරෙක් විසින් ප්‍රකාශ් සහ පරමේශ්වරීගේ විවාහය ලියාපදිංචි නොකිරීම හේතුවෙන් එය වලංගු නොවන බව ප්‍රකාශ්ට ප්‍රකාශකර සිටියේය.

ඉහත සිදුවීම ඇසුරින් පහත අවස්ථාවන්හි නෛතික වලංගුතාව සාකච්ඡා කරන්න

- **i.** ඔවුන්ගේ විවාහයේ වලංගුභාවය දැන ගැනීමට පරමේශ්වරීට අවශ්‍ය වේ. **(ලකුණු 10)**
- **ii.** සියලු පාර්ශවයන් උඩරැටියන් වූයේ නම් ඔබේ පිළිතුර වෙනස් වන්නේද? **(ලකුණු 05)**
- **iii.** එම විවාහය වලංගුව තිබියදී දී ප්‍රකාශ් ඉස්ලාම් ආගම වැළඳගෙන 2020 දී මුෆීජා නම් මුස්ලිම් කාන්තාවක් විවාහ කර ගැනීම **(ලකුණු 05)**

5. සාමාන්‍ය නීතියෙන් පාලනය වන සූරාජ් සහ වජිරා 2005 විවාහ විය. සූරාජ් ව්‍යාපාරිකයෙකු වන අතර ඔහුගේ ව්‍යාපාරයේ දියුණුව වෙනුවෙන් වැඩි වශයෙන් කාලය කැප කරයි. වජිරා හෙදියක වන අතර ඇයද ඇයගේ රාජකාරී කටයුතු සමඟ කාර්යය බහුලය. වයස අවුරුදු 08 ක දියණියක් සහ වයස අවුරුදු 06 ක පුතෙකු වශයෙන් ඔවුන්ට දරුවන් දෙදෙනෙකි.

සූරාජ් සහ වජිරාගේ පළමු දරුවා ඉපදීමෙන් පසු ගාල්ලේ ජීවත් වූ සූරාජ්ගේ මව සහ පියා කොළඹ සූරාජ්ගේ නිවසේ පදිංචියට පැමිණ එම දරුවන් දෙදෙනා කුඩා කළ සිට රැකබලා ගනු ලැබීය. දරුවන්ද ඔවුන්ට සමීපව ඉතාමත් කීකරුව හැදී වැඩුණි. කුඩා පුතුට වසර 5ක් සම්පූර්ණ වීමෙන් පසු සූරාජ්ගේ මව සහ පියා ගාල්ලේ පිහිටි ඔවුන්ගේ නිවසේ යළි පදිංචියට ගියහ. අනතුරුව දරුවන් ඔවුන්ගේ ආච්චී සහ සීයා සමග සමීපව සිටි අතර දරුවන් ඔවුන්ගේ ආච්චී සහ සීයා සමග නිතරම දුරකතනයෙන් කතාබස් කළහ. ඔවුන් සෑම පාසල් නිවාඩුවක්ම ගත කරනු ලැබුවේ ගාල්ලේ සිය ආච්චී සහ සීයාගේ නිවසේය.

සූරාජ් නිතරම බීමතින් නිවසට පැමිණේ. වජිරා රාත්‍රී වැඩ සඳහා නිවසින් පිටත යාම පිළිබඳ ඔහු කැමැති නැත. පසුව වජිරා සහ සූරාජ් රණ්ඩු කිරීමට පටන් ගත් අතර සූරාජ් බීමතින් සිටින විට ඔහු ඇයට පහර දෙන්නටද විය. දිනක් සූරාජ් සමඟ බහින්බස් වීමකින් අනතුරුව වජිරා නිවසින් ගොස් දෙහිවල ඇයගේ දෙමාපියන් සමඟ ජීවත් විය. වජිරාට දරුවන්ව ලබා

ගැනීමට අවසර නොදුන් අතර ඇය දරුවන්ව බැලීමද සූරාජ් ප්‍රතික්ෂේප කළේය. ඔවුන්ගේ දරුවන් බලා ගැනීම සඳහා සූරාජ් වයස අවුරුදු 70 ක මහළු කාන්තාවක් ගෙනාවේය. සූරාජ් නිතරම මත් පැන් පානය කිරීමෙන් පසු නිවසට එන බව වජිරා දැනගත්තේය.

**i.** දරුවන් දෙදෙනාගේ භාරකාරත්වය ලබා ගැනීමට වජිරා අදහස් කරයි. වජිරාට උපදෙස් දෙන්න. **(ලකුණු 10)**

**ii.** දරුවන් දෙදෙනාගේ භාරකාරත්වය ලබා ගැනීමට සූරාජ්ගේ දෙමාපියන් අදහස් කරයි. ඔවුන්ට උපදෙස් දෙන්න. **(ලකුණු 10)**

**6.** '1989 දී එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය සම්මත කර ගැනීම ළමා අයිතිවාසිකම් ක්ෂේත්‍රයේ විශාල ජයග්‍රහණයක් විය. සමස්තයක් වශයෙන් ගත් කළ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය ළමුන්ගේ සහභාගීත්ව අයිතිවාසිකම්, ආරක්ෂණ අයිතිවාසිකම් සහ ප්‍රතිපාදන අයිතිවාසිකම් ගැන යොමු වෙයි.'

දේශීය සහ විදේශීය අධිකරණ බලයන් යටතේ නෛතික, අධිකරණමය සහ පරිපාලනමය සංවර්ධනය ඇසුරින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. ඔබ විසින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ අදාළ ප්‍රතිපාදන දැක්විය යුතුය.

**(ලකුණු 20)**

**7.** වලංගු දරුකමට හදා ගැනීමේ නියෝගයක් මගින් හදා ගනු ලබන දරුවාට දරුකමට හදා ගනු ලබන පුද්ගලයාගේ නීත්‍යානුකූල විවාහයක උපන් දරුවකුගේ තත්වය ලබා දෙන අතර දරුවා සම්බන්ධයෙන් අනාගත භාරකාරත්වය, නඩත්තුව සහ අධ්‍යාපනය පිළිබඳව දෙමාපියාගේ හෝ භාරකරුගේ අයිතිවාසිකම්, යුතුකම් සහ වගකීම් අහෝසි වී දරුකමට හදා ගනු ලබන දෙමාපියන් වෙත මාරුවේ.

පහත අවස්ථාවන් කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ දරුවකු දරුකමට හදා ගැනීමේ නෛතික තත්වය සාකච්ඡා කරන්න

- ශ්‍රී ලංකාව තුළ දරුවකු දරුකමට හදා ගැනීම
- විදේශික යුවළක් විසින් ශ්‍රී ලංකාවේ දරුවකු දරුකමට හදා ගැනීම

**(ලකුණු 20)**

**8.** පහත මාතෘකා ගැන කෙටි සටහන් ලියන්න

i. උත්ප්‍රේක්ෂිත විවාහය

ii. දරුවන් විසින් දෙමාපියන් නඩත්තු කිරීම

iii. මුස්ලිම් නීතිය යටතේ විවාහය සඳහා වන අවම වයස

iv. රෝම ලන්දේසි නීතිය යටතේ විවාහ ශුන්‍යතාවයට පදනම්

**(5 x 4 = ලකුණු 20)**

*- හිමිකම් ඇවිරිණි -*